# 08

# මහින්දගමනයට පෙර ලංකාවේ පැවති බුදුසමය හා වෙනත් ආගමික විශ්වාස

කථිකාචාර්ය දෙඩම්කුඹුරේ ධම්මදස්සි හිමි

ක්‍රි:පූ: තුන්වන සියවසේ දඹදිව අශෝක රජුගේ පුත් මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කොට බුදුදහම හඳුන්වා දී ස්ථාපිත කරවූ බව මූලාශ්‍රයන්හි දැක්වේ[1] මහින්දගමනයේ ඓතිහාසිකත්වය පුරාවිද්‍යා මූලාශ්‍රයන්ගෙන් ද තහවුරු වී ඇත[2]

ප්‍රාග් බෞද්ධ යුගය ලෙස මහින්දගමනයට පෙර අවධිය හැඳින්වීමට බොහෝ විද්වතුන් කැමති වන අතර මේ අවධියේ බුදුදහම පිළිබඳ මෙරට වාසීන් තුළ කිසිදු දැනුමක් නො තිබූ බව පෙන්වා දීමට ඔවුහු උත්සුක වෙති. ප්‍රාග් බෞද්ධ යුගය පිළිබඳ සාකච්ඡාවට මෙහි දී පාදක කරගෙන ඇත්තේ ප්‍රධාන වශයෙන් වංශ කථාවල සඳහන් පණ්ඩුකාභය යුගයේ රජුගේ ආගමික ප්‍රතිපත්තින් ය. එයට අමතරව විජයාගමනයේ සිට දේවානම්පියතිස්ස අවධිය දක්වා වූ විවිධ සිද්ධීන් ද මිහිඳු හිමියන් හා සම්බන්ධ සිද්ධීන් ද උපයෝගී කර ගෙන ඇත. මේ අනුව සමස්තයක් ලෙස ප්‍රාග් බෞද්ධ යුගයේ පැවති ආගමික විශ්වාස හා ඇදහිලි කොටස් කිහිපයකට වර්ග කළ හැකිය.

1. බ්‍රාහ්මණ සමය
2. ශ්‍රමණ සම්ප්‍රදාය (ජෛන/ආජීවක/පරිබ්‍රාජක/පාෂාණ්ඩ/තාපස/ශ්‍රමණ)
3. යක්ෂ, යක්ෂණී, දේව, නාග, ශිව ලිංග, වන්දනය
4. ස්වභාවික වස්තු වන්දනය
5. මළවුන් ඇදහීම